CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைளைக் கண்காணிப்பதற்கான நிலையம்

No 160G, Poorwarama Road, Kirulapone. **Tel:** +94 11 2826388/+94 11 2826384
**Tel:** +94 11 2826381/+94 11 2826387/+ 94 11 2826380
**Fax**: +94 11 2826146 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

# 2019 ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ ගැටළු පිළිබඳ නිවේදනය

ශ්‍රී ලාංකික ඡන්දදායකයින්ට ඉදිරියේ පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා ස්වකීය ඡන්දකාඩ්පත් නොලැබීම සහ ඒ පිළිබඳව තම තමන්ගේ වසමෙහි ග්‍රාම නිළධාරීවරුන් හරහා හෝ අන්තර්ජාලය හරහා විමසීමේදී ස්වකීය නම් වර්ෂ 2018 ඡන්ද නාමලේඛනයෙහි නොතිබීම යන තත්වයන් පිළිබඳව පුළුල් වශයෙන් වාර්තා වන සිද්ධි සම්බන්ධයෙන් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි අවධානය යොමුව තිබේ. එවැනි සිදුවීම් පිළිබඳ මේ වනවිට පැමිණිලි 100ක් පමණ මැ.ප්‍ර.නි.ම.ට වාර්තා වී තිබෙන අතර එකී පුද්ගලයින්ගේ නම් ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයේද නොමැති බව වාර්තා වේ.

මැ.ප්‍ර.නි.ම. විසින් මෙකී ගැටළු සම්බන්ධයෙන් පසුගිය සතියේදී මැතිවරණ කොමිසමට වාර්තා කරන ලද අතර ඒ සඳහා මැතිවරණ කොමිසමෙන් මේ වනතෙක් ප්‍රතිචාරයක් ලැබී නොමැත. මේ අතර ඉහත කී ගැටළුව සම්බන්ධයෙන් ඡන්ද දායකයින්ගේ අවධානය ලැබීම සමාජ ජාලා මාධ්‍ය තුළ වැඩිවශයෙන් දැකගත හැකිය. ඡන්ද දායකයින්ගේ නම් ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනයේ නොමැති නම් ඒ සම්බන්ධයෙන් ස්වකීය ග්‍රාම නිළධාරීවරුන් හමුවීම සහ ඒ බව තහවුරු කරගැනීම සම්බන්ධයෙන් විවිධ වූත්, පරස්පර විරෝධී වූත් තොරතුරු බොහොමයක් මේ වනවිට පුළුල් ලෙස පැතිරෙමින් පවතී. මේ තත්වය සම්බන්ධයෙන් ස්වකීය අවධානය යොමු කරන මැ.ප්‍ර.නි.ම. යෙහි අදහස වන්නේ මෙවැනි ව්‍යාකූල තත්වයක් මත ඡන්දදායකයින් සිය ඡන්දය භාවිතා කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථානයට ප්‍රවේශ වූ විට තමන්ගේ නම ඡන්ද නාමලේඛනයෙහි නොමැති බව දැනගනු ලබන අවස්ථාවක, ඡන්ද මධ්‍යස්ථානයන්හි කඩාකප්පල්කාරී තත්ත්වයන් උද්ගත වීමේ හැකියාව සහ ඡන්දය භාවිතා කිරීමට නොහැකි වීම සම්න්ධයෙන් තත්ත්වයක් පැවතීමේ ප්‍රවනතාවයෙහි බලපෑම පිළිබඳව වඩාත් සැලකිලිමත් යයුතු බවයි.

**මැ.ප්‍ර.නි.ම. විසින් ඉල්ලා සිටිනු ලබන්නේ, මෙම තත්ත්වය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් මැතිවරණ කොමිෂන් සභාව මගින් ඉතා ඉක්මනින් සිදු කළයුතු** බවත් ඡන්දකාඩ්පත් ලැබී නොමැති සහ තමන්ගේ නම ඡන්ද නාමලේඛනයෙහි නොමැති ඡන්දදායකයින් සඳහා පැහැදිලි උපදෙස් ලබාදිය යුතු බවත්ය. එමෙන්ම ඡන්ද නාමලේඛනය පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා මැතිවරණ කොමිසම විසින් මැතිවරණ නිළධාරීන්ට ලබාදී ඇති උපදෙස් කවරේද යන්න පිළිබඳ විස්තර ද ලබාදෙන ලෙස මැ.ප්‍ර.නි.ම. විසින් ඉල්ලා සිටී.

විශේෂයෙන්ම තමන්ගේ ඡන්ද කාඩ්පත නොලැබීඇත්නම්, **ඡන්ද දායකයින්ගේ නාම ලේඛනය පිළිබඳ විස්තර මැතිවරණ කොමිසමේ https://eservices.elections.gov.lk/myVoterRegistration.aspx යන වෙබ් අඩෙවිය ඔස්සේ ප්‍රවේශ වී විමසා බලන ලෙස මැ.ප්‍ර.නි.ම. විසින් ඡන්දදායකයන්ට උපදෙස් ලබාදේ.**

ඡන්දදායකයින්ගේ තොරතුරු ලබාදුන් පසුව, **ඔවුන් ඡන්ද නාමලේඛනයෙහි සිටී නම්** මැ.ප්‍ර.නි.ම. විසින් පහත සඳහන්උපදෙස් ලබාදේ.

1. අදාළ විස්තර දිස්වන තිරයෙහි ඡායාරූපයක් ගෙන එය මැතිවරණ දින ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන යන්න.

2. තමන්ගේ ඡන්ද මධ්‍යස්ථානය කවර ස්ථානයක තිබේදැයි තහවුරු කර ගන්න.

3. ඡන්දය දැමීම සඳහා ඡන්දකාඩ්පතක් අනිවාර්ය නොවන අතර අවශ්‍ය වන්නේ වලංගු හැඳුනුම්පතක්ය.

ස්වකීය තොරතුරු ලබාදීමෙන් පසුව, යම් හෙයකින් ඡන්ද දායකයින් ඡන්දනාම ලේඛනයෙහි නොමැති අවස්ථාවකදී, අදාළ දිස්ත්‍රික් මැතිවරණ නිළධාරීන් හෝ ජාතික මැතිවරණ ලේකම් කාර්යාලය ඔස්සේ තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ පැහැදිලි කරගන්නා ලෙසට මැ.ප්‍ර.නි.ම. ඡන්දදායකයින්ට උපදෙස්දේ.

දිස්ත්‍රික් මැතිවරණ නිලධාරීන්ගේ ලැයිස්තුව https://elections.gov.lk/web/en/contact-us/contact-information/district-offices/. යන වෙබ්අඩවියෙන් ලබා ගත හැකිය.

ජාතික මැතිවරණලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය, කොළඹ යන ස්ථානයෙහි පවතින අතර දුරකථන අංක 0112868441 හෝ 0112868442 ඔස්සේ සම්බන්ධකර ගත හැක.

මැ.ප්‍ර.නි.ම. විසින් සියලුම ඡන්දදායකයන්ගෙන් ඉල්ලා සිටින්නේ ඉතා සාමකාමීව හැසිරෙන ලෙසත් සාමකාමී මැතිරිණයක් පැවැත්වීමට ඇති ඉඩකඩට තර්ජනයක් වන ලෙස ක්‍රියානොකරන ලෙසත්ය. ඉහතින් පෙන්වාදුන් ගැටළුකාරී තත්වය සම්බන්ධයෙන් පැහැදිලිකිරීමක් කරනලෙස මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටී.